# NDDCB NEWSLETTER

Volume 31 - (January to March 2022)
National Dangerous Drugs Control Board
State ministry of Defence



- <u>**මඟපෙන්වීම**</u>

- **විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මැතිනිය**
  **සභාපතිනිය**

- **ආශා ජයවර්ධන මැතිනිය**
  **අධ්‍යක්ෂ ජනරාල්**

**සංස්කාරක මඩුල්ල**

- හඳානි සේනානායක - අධ්‍යක්ෂ පර්යේෂණ
- තමර දර්ශන - සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ
- හිරුණි වත්සලා
- නිලුක්ෂි තිසේරා
- හංසිකා කේතුමාලි


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,

නො. 383,

කෝට්ටේ පාර,

රාජගිරිය.

**Tel – 011 2868794 – 6Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**Fb – National Dangerous Drug Control Board.**


## Vision

“ Build a Drug Free Health and Secured Nation”

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

“Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals”

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම”.



මතින් නිදහස් ජාතියක් ගොඩනැගීමේ ජාතික වගකීම පෙරදැරිව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් 2022 වර්ෂය තුළ සාධනීය පියවර රැසක් ගනිමින් සිටියි. රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මෙන්ම ජනතාවගේ සමාජ ආර්ථික යහපැවැත්ම කෙරෙහි බාධාවක් වශයෙන් හඳුනාගෙන ඇති මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය කිරීම ප්‍රධාන දිශානතිය වේ.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම කිරීම සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම කාන්තාවන්ට පැවරී ඇත. මෙය පවුල් ඒකකය තුළින් ආරම්භකර සමස්ත සමාජය දක්වා විහිදී යා යුතුව ඇත. ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මෙම කාලසීමාව තුළ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් වැඩසටහන් රාශියක් සිදු කර ඇත. මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් නිරෝගී පුරවැසියකු බිහිකිරීමෙහි ලා කාන්තාවන්ගේ භූමිකාව සහ කාර්යභාරය වඩාත් තීරණාත්මක සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින් සමස්ත කාන්තා පරපුර මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සක්‍රීය දායකත්වය දැක්විය යුතු කාලය එළඹ ඇති අතර ඒ වෙනුවෙන් මා විවෘත ආරාධනාවක් කරනු කැමැත්තෙමි.

**විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු**

**සභාපතිනිය**



# Special Events

## ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සැමරුම් වැඩසටහන් පැවැත්වීම

දැයේ දියුණුව වැඩි කරන්නට ළයේ තෙත්බව හැඟෙන්නී
මවක් විලසින් ඔබේ ලෝකය දැයේ අපි අද දකින්නී
තුටින් බිරිඳක් ලෙසින් ලෝකෙට දුවා දරුවන් මවන්නී
බිළිඳියක සේ ජනිත වූ ඇය ලොවේ විශ්මිත මවන්නී

පවුල් සංස්ථාව සමාජය තුළ මූලික තැනුම් ඒකකය වනු ඇත. එම පවුල් ඒකකය තුළ ජීවත්වන සමාජිකයින් අතරින් කාන්තාවට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. එනම් සමාජයක පැවැත්ම කෙරෙහි කාන්තාවකගේ කාර්යයභාරය ඉතාමත් වැදගත්වනු ඇත. කොන්ක්‍රීට් වනාන්තර තුළ මහා මන්දිර බොහෝ නිර්මාණය කිරීම පහසුය, නමුත් සොඳුරු නිවහල් නිවහනක් තැනීමට ඒ කිසිවකුටත් නොහැකිය. එය හැකිවන්නේ කාන්තාවකටය. එවැන් කාන්තාවන් සඳහා වෙන් වූ සුවිශේෂී දිනයක් පවතී. එබැවින් සෑම වසරකම මාර්තු මස 08 වන දිනට ජාත්‍යන්තර කාන්තා දින සැමරුම යොදා ගැනේ. මෙවර තේමාව එහි වූයේ " රටකි, දැයකි, ලොවකි , ඇය" යන්නයි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව විවිධ වූ සැමරුම් වැඩසටහන් පවත්වන ලදි.

### 1. කාන්තා දිනයට සමගාමීව පැවැත්වූ මණ්ඩල සාකච්ඡාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිනී විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මැතිනියගේ ප්‍රධානත්වයෙන් හා සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ/බාහිරසේවා (ආවරණ) තමර දර්ශන මහතාගේ මෙහෙයවීම මත මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපනයෙහිලා කාන්තාවගේ භූමිකාව යන තේමාව යටතේ මෙම වැඩසටහන zoom තාක්ෂණය ඔස්සේ සිදු කරන ලදි. එහි සම්පත් දායකත්වය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී ප්‍රියදර්ශනී රත්නායක මෙනෙවිය හා උපදේශන නිලධාරී උදේනි රණසිංහ මහත්මිය විසින් දක්වනු ලැබුණි.










## 2. මොරටුව ප්‍රදේශයේ පැවති දැනුවත් කිරීමේ වැඩසටහන්

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරී ඒ. එම්. සී. අමරසිංහ මහත්මියගේ මූලිකත්වයෙන් මොරටුව කාන්තා බලමණ්ඩලයේ සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු පවතින කාන්තාවන් ඉලක්ක කරමින් සංවිධානය ලද අතර වැඩසටහන මොරටුව බෞද්ධ මන්දිරයේ පවත්වන ලදි. මෙම වැඩසටහන තුළ දී උපදේශනය අවශ්‍ය කාන්තාවන් සඳහා උපදේශන සහායද ලබාදෙන ලදි.

තවද, මොරටුව කවිධජ භාවනා මධ්‍යස්ථානයේ කාන්තා දිනය වෙනුවෙන් වැඩසටහනක් පවත්වන ලදි. මෙම වැඩසටහන සඳහා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමියගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සාමාජිකයින්, මොරටුව අධිකරණ ප්‍රජාවිශෝධන නිලධාරි, ආයුර්වේද වෛද්‍යතුමිය, මත්ද්‍රව්‍ය නිවාරණ සහායකයින් සහ මොරටුව ප්‍රදේශයේ කාන්තාවන් සහභාගී විය.








### 3. කර්මාන්තපුර ආශ්‍රිත සේවකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

### අවිස්සාවේල්ල MAS Holdings කර්මාන්තශාලාවේ වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා සහකාර එස්. සී. තොටවත්තගේ පියතුමාගේ මූලිකත්වයෙන් 2022.03.05 දින අවිස්සාවේල්ල කර්මාන්තපුරයේ **MAS Holdings** කර්මාන්ත ශාලාවේ ජාත්‍යන්තර කාන්තා දිනය අරමුණු කරගනිමින් එහි සේවයේ නිරත කාන්තාවන් 1200 ක් පමණ වූ පිරිසක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. එහි සම්පත් දායකත්වය, සහකාර අධ්‍යක්ෂ විද්‍යාත්මක පර්යේෂණ, පබසරා වීරසිංහ මිය, බාහිරසේවා නිලධාරිනී දේවිකා මදුරප්පෙරුම යන මහත්මීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි. මෙහිදී 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ද සිදුකරන ලදි .





### තුල්හිරිය MAS Holdings කර්මාන්ත ශාලාවේ වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා සහකාර එස්. සී. තොටවත්තගේ පියතුමාගේ මූලිකත්වයෙන් 2022.03.08 දින තුල්හිරිය කර්මාන්තපුරයේ **MAS Holdings** කර්මාන්ත ශාලාවේ ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කරගනිමින් එහි සේවයේ නිරත කාන්තාවන් 3200 ක් පමණ වූ පිරිසක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. එහි සම්පත් දායකත්වය සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ/ බාහිරසේවා (ආවරණ) තමර දර්ශන මහතා, සහකාර අධ්‍යක්ෂ විද්‍යාත්මක පර්යේෂණ පබසරා වීරසිංහ මිය, බාහිරසේවා නිලධාරිනී දේවිකා මදුරප්පෙරුම යන මහත්ම යන මහත්මීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි. මෙහිදී 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ද සිදුකරන ලදි.







**කුරුණෑගල , ඉබ්බාගමුව ප්‍රදේශයේ JK ඇඟලුම් කර්මාන්ත ශාලාවේ ඇඟලුම් සේවිකාවන් සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරිනී ලක්මි නිලංකා ද සිල්වා මහත්මිය විසින් කුරුණෑගල, ඉබ්බාගමුව ප්‍රදේශයේ JK ඇඟලුම් කර්මාන්ත ශාලාවේ ඇඟලුම් සේවිකාවන් සඳහා "මගේ පවුලේ Counselor මමයි" යන තේමාව පාදක කරගනිමින් වැඩසටහනක් පැවැත්විය. මේ සඳහා ඇඟලුම් සේවිකාවන් 750 දෙනෙකු පමණ සහභාගී වූහ.





**හෝමාගම AJS Industries කර්මාන්ත ශාලාවේ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

ජාත්‍යන්තර කාන්තා දිනය සඳහා මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු හේතුවෙන් කාන්තාවන් මුහුණදෙන ගැටලුකාරී තත්ත්වයන් සහ මත්ද්‍රව්‍ය නිවාරණය හා ප්‍රතිකාර සඳහා යොමු වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022.03.08 වන දින හෝමාගම AJS Industries අත් වැසුම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවේ සේවක සේවිකාවන් සඳහා සිදු කරන ලදි. මත් නිවාරණ සහායක දිනේෂ් ප්‍රියසාද් මහතා සංවිධාන සහාය ලබා දෙන ලදි. එහි සම්පත්දායකත්වය උපදේශන සහකාර (බාහිරසේවා) නිලධාරී පී. ඒ. එන්. පද්මසිරි මහත්මිය විසිනි.









### 4. **මහරගම ප්‍රදේශයේ දැනුවත් කිරීමේ වැඩසටහන්**

මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම පෙර පාසල් ගුරුභවතුන් සඳහා උපදේශන වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ඒ සඳහා ප්‍රදේශයේ සියලුම පෙර පාසල් ගුරු භවතුන් සහභාගි වූ අතර එහිදී වර්තමානයේ ප්‍රදේශයේ පවතින මත්ද්‍රව්‍ය ගැටලුව සහ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සඳහා පෙර පාසල් ගුරුභවතුන්ගේ භූමිකාව යන මැයෙන් ප්‍රායෝගික දේශනයක් පවත්වන ලදි. මෙහිදී 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ද සිදුකරන ලදි.







තවද , ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තාවන් දිරිගැන්වීම සහ සවිබලගැන්වීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහනක් පන්නිපිටිය තරුණ බෞද්ධ සංගම් ප්‍රධාන ශාලාවේ දී පසුගිය මාර්තු මස 8 වනදා පන්නිපිටිය, මහරගම සංවර්ධන නිලධාරින් විසින් පවත්වනු ලැබූ අතර ඒ සඳහා සම්බන්ධ වූ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහකාර උපදේශන නිලධාරිනී කල්හාරි රාජපක්ෂ මිය විසින් වර්තමානයේ රටේ පවතින මත්ද්‍රව්‍ය ගැටලුව සහ ප්‍රාදේශීය වශයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සිදු කෙරෙන ආකාරය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදි. මෙහිදී 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ද සිදුකරන ලදි.





**5.මාතලේ දිස්ත්‍රික්කය තුළ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

2022 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ලග්ගල ප්‍රදේශයේ පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ප්‍රජා ප්‍රතිකාරය පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. එමෙන්ම ලග්ගල නගරයේ වෙළඳසැල් සඳහා 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව සහිත ස්ටිකර් ප්‍රදර්ශනය කිරීම සහ අත් පත්‍රිකා බෙදා දෙමින් සමාජය දැනුවත් කිරීමේ වැඩසටහනක් බාහිරසේවා නිලධාරිනී නිහතමානී බුලත්සිංහල මහත්මිය විසින් සිදුකරන ලදි.







## 6.පන්කැටිය කහගල්ල වතුකරයේ  පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්

ලෝක කාන්තා දිනය පාදක කොට ගෙන මාර්තු 08 වන දින හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පන්කැටිය කහගල්ල වතුකරයේ කාන්තාවන් සඳහා "කාන්තාව සවිබල ගැන්වීම හා මතින් නිදහස් පවුලක්" යන තේමාව යටතේ දැනුවත් කිරීමේ වැඩසටහනක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරිනී ඉමන්දි සමරකෝන් මිය විසින් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඒකාබද්ධව පවත්වන ලදි.









**7.දොඩංගොඩ,  බේරුවල, කළුතර යන ප්‍රදේශවල පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

2022/03/09 දින කළුතර ප්‍රජා පාදක විශෝධන කාර්යාලය විසින් කාන්තා දිනය ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි. මේ සඳහා කළුතර අධිකරණයේ ප්‍රජා පාදක විශෝධන නිලධාරිතුමන්, වැඩ පරීක්ෂකතුමිය, මෙන්ම දොඩංගොඩ, බේරුවල, කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රජා විශෝධන සංවර්ධන නිලධාරින් සම්බන්ධ විය. මෙහිදී කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නියෝජනය කරමින් "සුරක්ෂිත පවුලක් සදහා නුතන පුරුෂයාගේ භූමිකාව සහ මතින් නිදහස් පවුලක්" යන මාතෘකාව යටතේ දැනුවත් කිරීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහකාර බාහිරසේවා නිලධාරි එච්. බුද්ධි එරංගිකා මහත්මිය විසින් සිදු කරන ලදි.







**8.සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

”රටකි, දැයකි, ලොවකි ඇය” යන ජාත්‍යන්තර කාන්තා දින තේමාව මූලික කර ගනිමින් අවිස්සාවේල්ල මානික්කවත්ත විහාරස්ථානයේ දී කාන්තා දින සැමරුම් වැඩසටහනක් මාර්තු මස 08 වන දින පවත්වන ලදි. විවිධ භූමිකා හමුවේ කාන්තාව මුහුණ දෙන අභියෝග ජය ගැනීම පිළිබඳව ක්‍රියාකාරකම් ඇසුරෙන් අවබෝධය ලබා දීම මෙහිදි සිදුවිය.

මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා රක්ෂණ නිලධාරි, සමස්ත සංවර්ධන නිලධාරින්, වසම්හි ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ මත් නිවාරණ සහායකයන්ගේ සහභාගිත්වයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා නිලධාරිනී දේවිකා මදුරප්පෙරුම මහත්මිය විසින් සිදු කරන ලදි.







**9. කුරුවිට බන්ධනාගාරය තුළ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

"රටකි, දැයකි, ලොවකි ඇය" යන තේමාව මුලික කර ගනිමින් කුරුවිට බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් 25 දෙනෙක් හා පුනරුත්ථාපන අංශයේ නිලධාරින්ගේ සහභාගීත්වයෙන් දිරිය කතක් ලෙස සාර්ථකව ජීවත්වන්නේ කෙසේද? යන්න පිළිබඳව වැඩසටහනක් සිදුකරන ලදී. අන්තරායකර



ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරිනී, චානිකා අබේසිංහ මහත්මියගේ සම්පත් දායකත්වයෙන් මෙම වැඩසටහන සිදු කරන ලදී.



**10. වාරියපොළ බන්ධනාගාරය තුළ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් වාරියපොළ බන්ධනාගාරය තුළ කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. එහි සම්පත් දායකත්වය බාහිර සේවා නිලධාරිනී සුරංගි වෙලගෙදර මහත්මිය හා බාහිරසේවා නිලධාරිනී ලක්මි නිලංකා ද සිල්වා මහත්මිය විසින් දක්වන ලදී.





## නව අධ්‍යක්ෂ ජනරාල්තුමිය රාජකාරී භාර ගැනීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නව අධ්‍යක්ෂ ජනරාල් ධූරය සඳහා එච්. ඒ. ඒ. එන් ජයවර්ධන මැතිතුමිය ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මැතිතුමිය ඉදිරියේ 2022-03-16 දින වැඩ භාරගන්නා ලදි. මෙම අවස්ථාව සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල නිලධාරීන් සහ ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වූහ.









## පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ දුර්භාවිතයේ ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් පැවැත්වීම, ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාර ගැනීම පර්යේෂණ අංශය විසින් සිදු කරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රතිපත්ති සකස් කරන පාර්ශවයන්ට, සේවා සපයන්නන්ට, සේවාලාභීන්ට හා පහසුකම් සපයන්නන්ට මත්ද්‍රව්‍ය ආශ්‍රිත වාර්තා සකස් කිරීම හා අදාළ තොරතුරු ලබා දීම ප්‍රධාන කාර්යයන් වේ.

**මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත පර්යේෂණ/අධ්‍යයන**


පහත සමීක්ෂණ/අධ්‍යයනවල දත්ත රැස්කිරීම හා වාර්තා සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

- මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන්ගේ ව්‍යාප්තිය හා ප්‍රවණතා පිළිබඳව සමීක්ෂණය
- මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ සමස්ත යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම සම්බන්ධ තක්සේරුකරණය
- අධි අවධානම් කණ්ඩායම් අතර අලුතින් උද්ගත වන මත්ද්‍රව්‍යය භාවිත රටාවන් සහ චර්යාවන් සම්බන්ධ හරස්කඩ අධ්‍යයනය
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තත්ත්වය විශ්ලේෂණය සහ වැඩසටහන් සැලසුම්කරණයට අදාළ අවශ්‍යතා තක්සේරුව
- නීතිවිරෝධී ගංජා වගාව සහ ගංජා භාවිතය සහ ඖෂධමය භාවිතාව සඳහා ගංජා නීතිගත කිරීම පිළිබඳ මත විමසුම

පර්යේෂණ අංශය මඟින් සම්පාදිත මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ අත්පොත, මණ්ඩලීය ත්‍රෛමාසික සඟරාව, මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධව අත්අඩංගුවට පත් පුද්ගලයන් පිළිබඳව සංඛ්‍යාලේඛන වාර්තාව සහ ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව සහ ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව, පර්යේෂණ වාර්තා සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වාර්තා යනාදිය www.nddcb.gov.lk යන වෙබ් අඩවියෙහි ප්‍රකාශන යටතේ ලබාගත හැකිය. එමෙන්ම 0112868794-6 Ext – 329/330/325 දුරකථන අංක ඔස්සේ පර්යේෂණ අංශය අමතා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාගත හැකිය.

## "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව- VI වන වෙළුම "

දේශීය හා ගෝලීය වශයෙන් සමකාලීන සමාජ ගැටලු නිර්මාණය වීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති ප්‍රධාන සාධකයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතය හඳුනාගෙන ඇත. එක් භූගෝලීය කලාපයකට හෝ එක් ඉලක්ක කණ්ඩායමකට සීමා නොවී සෑම ස්ථරයකටම සමාජ, ආර්ථික, දේශපාලන සහ සෞඛ්‍ය ආදී වශයෙන් සෘණාත්මක බලපෑම් මේ හරහා උද්ගත වී ඇත. "මත්ද්‍රව්‍ය භාවිතය" සම්බන්ධ විවිධ දිශානතීන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන/ සමීක්ෂණ කිහිපයක වාර්තා සංග්‍රහිත කරමින් " **ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව- VI වන වෙළුම "** සම්පාදනය කර ඇත. සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයන්, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් සැලසුම්කරණය සඳහා වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම තහවුරු කිරීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට අවශ්‍ය පරිශීලන මූලාශ්‍රයක් වශයෙන් සමාජගත කිරීමේ අරමුණින් මෙම පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කර ඇත.




මෙම ග්‍රන්ථයේ අන්තර්ගතයෙහි"**මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණයේ**" වාර්තාව ඉදිරිපත් කර ඇත. එහිදී, මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සමාජ විද්‍යාත්මක පැතිකඩ, මනෝ සමාජ ලක්ෂණ හා චර්යාත්මක වෙනස්කම් පිළිබඳ තොරතුරු, මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් ඉන් මුදවා ගැනීම හා හානිය අවම කිරීම සඳහා කළයුතු මැදිහත් වීම් පිළිබඳව මෙම සමීක්ෂණය මගින් තොරතුරු අනාවරණය කර ඇත.

එමෙන්ම **"විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය"** හරහා විද්‍යාර්ථීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ප්‍රවණතාවයන් පිළිබඳ අධ්‍යයනය කර ඇත. එහිදී විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ වර්තමාන ප්‍රවණතා, විශ්වවිද්‍යාලය තුළ මත්ද්‍රව්‍ය භාවිතය සහ ව්‍යාප්තිය සම්බන්ධ ප්‍රවණතා පිළිබඳ කරුණු අනාවරණ කර ඇත.

**"තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය"** මගින් තරුණයින් සහ නව යොවුන්වියේ පුද්ගලයින් අතර ප්‍රචලිතව පවතින විවිධ මත්ද්‍රව්‍ය වර්ග, මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ රටාවන්, මත්ද්‍රව්‍ය භාවිතයට බලපාන ලද පවුල් සාධක, පරිසරාත්මක සාධකවල බලපෑම හා මනෝ විද්‍යාත්මක සාධක මෙන්ම මෙම තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ගත යුතු ප්‍රතිපත්ති, සැලසුම් හා ක්‍රියාමාර්ග පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත.

**“දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය”** තුළින් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතයෙහි වර්තමාන ප්‍රවණතා සහ රටා කෙරෙහි අවධානය යොමු කර ඇත. එහිදී දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග දොරටු රසාගඳයක් වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල වාණිජ ඉල්ලුම ඉහළ යාම, මත්වීම පිණිස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වර්ග භාවිතා කරන්නන්ගේ ප්‍රමාණය ඉහළ යන ආකාරය පිළිබඳ අනාවරණය කර ඇත.

අවසාන වශයෙන් **“මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් නැවත භාවිතයට යොමුවීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සහ ප්‍රතිකාර ක්‍රියාවලියේ ප්‍රතිඵලදායක බව පිළිබඳ කඩිනම් සමීක්ෂණයේ ”** අනාවරණ **VI වන වෙළුම** ඉදිරිපත් කර ඇත.

මෙහිදී 2017 සහ 2018 වර්ෂවලදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන්ගේ පසුරැකවරණ තත්ත්වය පිළිබඳව සමීක්ෂණය සිදු කර ඇත.

පර්යේෂණ හා සමීක්‍ෂණවල සංකලනයෙන් යුතු මෙම ග්‍රන්ථය මගින් මත්ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සහ බාහිර සේවා වැඩසටහන් සැලසුම් කිරීමටත්, ඊට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමටත්, අදාළ ක්ෂේත්‍රයේ නියැළි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා පදනමක් සපයනු ඇත.

මෙම ග්‍රන්ථයේ පිටපත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ලබා ගත හැකිය.

## 1927 දුරකථන අංකය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශයේ නිලධාරීන් විසින් සිරිපා සමයේ වන්දනාකරුවන් ඉලක්කකර මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් 2022.03.26 වන දින පවත්වන ලදි.









## ප්‍රජාපාදක ප්‍රතිකාරය සඳහා පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිතුමියගේ සංකල්පයක් මත පොලිස් නිලධාරීන් ප්‍රජාපාදක ප්‍රතිකාරය සඳහා පුහුණු කිරීමේ වැඩසටහනේ 2022 වර්ෂයේ දී සිදු කරන ලදි.

එහිදී පහත සඳහන් මාතෘකා පිළිබඳ සාකච්ඡා කරනු ලැබුණි.

- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටලුවේ ස්වාභාවය
- මත්ද්‍රව්‍ය නිවාරණ යාන්ත්‍රණය පිළිබඳ දළ විශ්ලේෂණය සහ පාලනය
- මත්ද්‍රව්‍ය කාණ්ඩ, ඒවායේ බලපෑම් සහ මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේදී මතුවන අභියෝග
- මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ අභියෝග ජය ගැනීම සඳහා විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් හොඳම භාවිතයන්
- ප්‍රජා පාදක ප්‍රතිකාර ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් භාවිතයන්
- ප්‍රජා මූලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

ප්‍රථම පුහුණු කිරීමේ වැඩසටහන 2022-01-29 සහ 30 කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරී එස්. සී. තොටවත්ත පියතුමන්ගේ සංවිධානත්වයෙන් පැවැත්විණ. මේ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් 90 දෙනෙක් සහභාගී විය.

ඉහත වැඩසටහනට අමතරව කොළඹ, ගම්පහ, කුරුණෑගල, ගාල්ල, අනුරාධපුර හා ගාල්ල යන දිස්ත්‍රික්ක වල පොලිස් නිලධාරීන් ප්‍රජාපාදක ප්‍රතිකාරය සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර නිලධාරීන් විශාල සංඛ්‍යාවක් මේ සඳහා සහභාගී විය.















# STATISTICS


## 2021 වර්ෂයේදී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් වලට ඇතුළත් වීම්

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් විවිධ ක්‍රමවේදය යටතේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් සපයනු ලබයි. එම ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් වලට ඇතුළත් වන සේවාලාභීන් සම්බන්ධයෙන් මාසිකට මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට වාර්තා කරන දත්ත මත පදනම්ව මෙම විශ්ලේෂණය සිදුකර ඇත.අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන හතර හැරුණු විට බන්ධනාගාර, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ ඇති කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සහ මණ්ඩලයේ ලියාපදිංචි ලත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන මගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර කරනු ලබයි. එසේ ප්‍රතිකාර ලබන්නන් පිළිබඳ මාසික වාර්තාවක් පර්යේෂණ අංශය වෙත ලැබෙන අතර 2021 වර්ෂයේදී ප්‍රතිකාර ලබා ගත් සේවාලාභීන් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙහි අන්තර්ගත වේ.

**මධ්‍යස්ථාන අනුව සේවාලාභීන් ඇතුළත් වීමේ සංයුතිය**

ඒ අනුව 2021 වර්ෂයේදී මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව 1,703 කි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව 751 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 44% කි. බන්ධනාගාර මගින් ප්‍රතිකාර ලබාගත් සංඛ්‍යාව 111 ක් ලෙසත්, පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් 249 ක් ලෙසත් වාර්තා වී තිබේ. කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව 592 ක් වන අතර ප්‍රතිශතයක් ලෙස 35%කි. 2020 වර්ෂය හා සසඳන කල ප්‍රතිකාර ලබා ගත් මුළු සංඛ්‍යාව 1,649 ක් වන අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව 3% ක වැඩි වීමකි. එය පහත පරිදි හඳුනාගත හැකිය.

**ප්‍රස්තාරය-01**





(මූලාශ්‍රයඃ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2020/2021)

### දිස්ත්‍රික්ක මට්ටම අනුව සේවාලාභීන්ගේ සංයුතිය

ප්‍රතිකාර ලබාගත් මුළු සංඛ්‍යාවෙන් 1,117 ක් බස්නාහිර පළාතෙන් වන අතර වැඩි පිරිසක් වාර්තා වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එය ප්‍රතිශතයක් ලෙස 31.9% ක් වන අතර ගම්පහ දිස්ත්‍රික්කයෙන් 474 දෙනෙක් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් 100 දෙනෙක්ද වාර්තා වී තිබේ. ගාල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රතිකාර ලබාගත් සංඛ්‍යාව 97 දෙනෙක් වන අතර, මහනුවර දිස්ත්‍රික්කයෙන් 60 ක් වන අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 85 ක් ද, රත්නපුර දිස්ත්‍රික්කයෙන් 26 ක් ද වාර්තා වී ඇත.

**වගුව - 01**





(මූලාශ්‍රයඃ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2021)

### ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් අතරින් 1,699 ක් එනම්, 99.8%ක් පුරුෂයින් වූ අතර 04 ක් ස්ත්‍රීන් විය. එය ප්‍රතිශතයක් ලෙස 0.2% කි. සමස්ත සේවාලාභීන්ගෙන් 58% ක් අවිවාහක අය වූ අතර, විවාහක ප්‍රතිශතය 31% ක් ලෙස වාර්තා වූ අතර දික්කසාද වූවන් 21% ක් ද, වෙන් ව ජීවත් වන අය 0.2% ක් ද වාර්තා වී ඇති අතර වාර්තා වී ඇති දත්ත වලට අනුව අවිවාහක පුද්ගලයින් වැඩිවශයෙන් ප්‍රතිකාර ලබා ගෙන ඇති බව නිගමනය කළ හැකිය. ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින්ගේ වයස් මට්ටම පිළිබඳ විමසා බලන කල බහුතරය වාර්තා වී ඇත්තේ, වයස අවුරුදු 25-29 කාණ්ඩයේ පසුවන සේවාලාභීන්ය. එය සංඛ්‍යාත්මකව 446 ක් වේ. වයස අවුරුදු 14 ට අඩු වයස් කාණ්ඩයේ සේවාලාභීන් 02 ක් ද, 15-19 ත් අතර 93 දෙනෙක්ද, 20-24 ත් අතර 441 දෙනෙක්ද, 30-34ත් අතර 324 දෙනෙක්ද, 35-49 අතර 164 දෙනෙක්ද, අවුරුදු 50ට වැඩි සේවාලාභීන් සංඛ්‍යාව 71 ක් විය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගේ වාර්ගිකත්වය සලකා බලන විට, සිංහල ජාතිය නියෝජනය කරන සේවාලාභීන් 1,509 දෙනෙක්ද, දෙමළ 71 ක් ද, මුස්ලිම් 100 දෙනෙක්ද, බර්ගර් 6 දෙනෙක්ද, මැලේ 7

දෙනෙක්ද විය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගේ ආගම සම්බන්ධයෙන් සලකා බලන කල ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගෙන් බහුතරයක් බෞද්ධ ආගම නියෝජනය කළ අතර, එය 1,308 කි (76.8%). 233 දෙනෙකු ක්‍රිස්තියානි ආගම ද, එක් අයෙක් ඉස්ලාම් ආගමද, 43 දෙනෙක් හින්දු ආගම ද නියෝජනය විය.

**ප්‍රස්තාරය - 02**




(මූලාශ්‍රයඃ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2021)

ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ සේවාලාභීන්ගේ අධ්‍යාපන මට්ටම සලකන විට, අධ්‍යාපනය නොලද සේවාලාභීන් සංඛ්‍යාව 20 දෙනෙක්ද, 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද සංඛ්‍යාව 45 දෙනෙක්ද, 5 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ සංඛ්‍යාව 458 දෙනෙක් ද, සාමාන්‍ය පෙළ සමත් සංඛ්‍යාව 812 දෙනෙක් ද, උසස් පෙළ අවසන් කළ සංඛ්‍යාව 328 ක් ද, විශ්ව විද්‍යාල/කාර්මික අධ්‍යාපනය ලැබූ සංඛ්‍යාව 29 දෙනෙක්ද වශයෙන් වාර්තා විය. 2021 දී වාර්තා වී ඇති තොරතුරු අනුව අඩු අධ්‍යාපනයක් ලද පිරිස් බහුතරයක් ප්‍රතිකාර සඳහා යොමුවීමක් පවතින බව හඳුනාගත හැකිය.

**ප්‍රතිකාර ක්‍රියාවලිය**

ප්‍රතිකාර ලබාගත් ක්‍රමවේදය අනුව නේවාසික/ආයතනගත ප්‍රතිකාර ක්‍රමවේදය බහුතරයක් තෝරාගෙන තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස 89%ක් පමණ වේ. එම සේවාලාභීන්ගේ ප්‍රතිකාර ක්‍රමය පිළිබඳ විමසා බැලීමේදී, මනෝවිද්‍යාත්මක උපදේශන ක්‍රමය පදනම් කර ගෙන ප්‍රතිකාර ලබා ගත් පුද්ගලයින් සංඛ්‍යාව 1,159 ක් විය. 12 පියවර ක්‍රමය යටතේ 26 දෙනෙකු, ප්‍රජා ප්‍රතිකාර ක්‍රමය යටතේ 70 දෙනෙකු, ආධ්‍යාත්මික සංවර්ධනය මූලික ක්‍රමය යටතේ 122 දෙනෙකු ද ප්‍රතිකාර ලබා ගෙන තිබුණි.

වගුව - 02


| ප්‍රතිකාර ක්‍රමය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| මනෝ විද්‍යාත්මක | 1,409 | 84.8 |
| ප්‍රජා ප්‍රතිකාර (TC) | 70 | 4.2 |
| බටහිර වෛද්‍ය | 10 | 0.6 |
| 12 පියවර | 26 | 1.6 |
| ආධ්‍යාත්මික සංවර්ධනය මූලික ආකෘති | 122 | 7.3 |
| වෙනත් | 24 | 1.4 |

(මූලාශ්‍රයඃ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2021)

**මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ ප්‍රාථමික මත්ද්‍රව්‍ය**

ප්‍රතිකාර ක්‍රියාවලියට ඇතුළත් වූ සේවාලාභීන්ගෙන් 1,392 ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රාථමික මත්ද්‍රව්‍ය ලෙස භාවිත කර තිබුණි. එමෙන්ම ගංජා භාවිත කළ පුද්ගලයින් 175 දෙනෙක් ද හෙරොයින් භාවිත කළ පුද්ගලයින් 45 දෙනෙක්ද හඳුනාගත හැකි විය. එය පහත ප්‍රස්තාරය මඟින් හඳුනාගත හැකිය.

**ප්‍රස්තාරය - 02**




(මූලාශ්‍රයඃ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2021)

**සේවාලාභීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය**

ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් භාවිත කළ මත්ද්‍රව්‍ය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී හෙරොයින් භාවිත කළ පුද්ගලයින් 1,464 ක් විය. ගංජා භාවිත කළ පුද්ගලයින් 218, අබිං භාවිත කළ පුද්ගලයින් 17 දෙනෙක්ද වූ අතර, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත

කළපුද්ගලයින් 130 දෙනෙක්ද, මද්‍යසාර භාවිත කළ පුද්ගලයින් 120 දෙනෙක්ද විය.

මත්ද්‍රව්‍ය භාවිත කිරීම සඳහා පුද්ගලයින් විවිධ ක්‍රමයන් අනුගමනය කර තිබූ අතර

කෑමක්/බීමක් ලෙස භාවිතා කළ පිරිස 182 දෙනෙක්ද, දුම්පානයෙන් 527 දෙනෙක්ද, එන්නත් කිරීම මගින් 36 දෙනෙක්ද, චීන ක්‍රමය මගින් 1,111 දෙනෙක්ද, නාසයෙන් ඉරීමෙන් 61 දෙනෙක්ද වාර්තා විය. 2021 වර්ෂයේ ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව 1,703 ක් වන අතර 2020 වර්ෂයේ ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව 1,649 ක් විය. 2020 වර්ෂයට සාපේක්ෂව ප්‍රතිකාර වලට ඇතුළත්වූවන්ගේ සුළු වැඩිවීමක් දැකගත හැකිය.

**පර්යේෂණ අංශය**

## ස්ත්‍රීත්වය, මත්ද්‍රව්‍ය භාවිත අවදානම් චර්යාවන් වර්ධනය වීම කෙරෙහි සිදු කරන බලපෑම

ලෝකයේ සෑම ජීවියෙකුම උප්පත්තියෙන්ම ස්ත්‍රී හෝ පුරුෂ යන ලිංගික බෙදීමකට ලක් වෙති. උප්පත්තියෙන්ම හිමිවන එම ලිංගිකත්වය මත පුද්ගලයින් සමාජයීය වශයෙන් වෙනස් චර්යාවන්ට, ආකල්ප වර්ධනයට මෙන්ම ජීවත් වීමට හුරු පුරුදු වී සිටිති. මේ පිළිබඳ සාකච්ඡාවට ලක් කිරීමට පසුකාලීනව පැමිණි ප්‍රධාන සංකල්පයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජ භාවය (Gender) යන්න සංකල්පගත කර ඇත. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යනුවෙන් හැඳින්වෙන්නේ, ගැහැනු හා පිරිමි දෙපාර්ශවයේ අනන්‍යතාව මත පදනම් වී කිසියම් සමාජයක් විසින් ගැහැණුන්ට හා පිරිමින්ට අනුකූල වේ යැයි සලකනු ලබන සමාජය විසින් ගොඩනගන ලද වෙනස්කම්, භූමිකාවන්, හැසිරීම්, ක්‍රියාකාරකම්, ආකල්ප, පෞරුෂ ගති ලක්ෂණ, විශේෂතා සහ කායික හා බුද්ධිමය හැකියාවන් යනුවෙනි.

ඉහත නිර්වචනයට අනුව ජීව විද්‍යාත්මක ව ලැබී තිබෙන තත්ත්වය මත කාන්තාව සහ පුරුෂයා හට සමාජයීය නිර්මිත තත්ත්වයක් මත ජීවත් වීමට සිදු වී තිබේ. කෙසේ වෙතත් මෙහි තිබෙන ගැටලුකාරී තත්ත්වය වන්නේ, ස්ත්‍රී පුරුෂ භාවය යන්න පදනම් කර ගනිමින් ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීමක් සිදු වීමයි. එය සමාජයේ ආර්ථික, දේශපාලනික, සමාජ හා සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයක් තුළ මෙම තත්ත්වය මැනවින් විද්‍යාමාන වී තිබෙන බවට පැහැදිලිව පෙනෙන තත්ත්වයකි.

එසේම කාන්තාවක් වීම නිසාම සමාජයීය වශයෙන් අභියෝග රැසකට මුහුණ දීමට කාන්තාවට සිදු වී තිබේ. දියණියක්, සහෝදරියක්, බිරිඳක්, මවක්, සමාජයේ සාමාජිකාවක් යන විවිධ භූමිකාවන් පවුල තුළ සහ සමාජය තුළ නිරූපණය කරන ඇය සමාජය තුළ එම තත්වයන් නිසාම අවදානම්

සහ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අතර කාන්තාවක් වීම නිසාම සමාජය අනුමත නොකරන චර්යාවන් වලට යොමු වීම හෝ යොමු කරවීමක් තුළින් ඇය සමාජයේ අවමානයට ලක් වීම සිදු වේ.

යුරෝපීය සංගමයේ ඇස්තමේන්තු කර ඇති පරිදි වයස අවුරුදු 15 - 64 දක්වා කාන්තාවන් මිලියන 35 ක් ජීවිතයේ යම් අවස්ථාවක දී නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අත්හදා බලා ඇති බවට වාර්තා කර ඇත. ඒ අනුව කාන්තාවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ගෝලීය ප්‍රවණතාවක් බවට පත්වෙමින් පවතින බවට හඳුනාගත හැකිය.

මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය ඇබ්බැහිය පිළිබඳ යුරෝපානු අධීක්ෂණ ආයතනය (EMCDDA) විසින් පෙන්වා දෙන පරිදි පිරිමින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා වැඩි වෙනස් තත්ත්වයක් කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ගැටලුව හා සම්බන්ධ වන බව යි. විශේෂයෙන්ම එය සමාජ ලක්ෂණ, මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇති වී තිබෙන ප්‍රතිවිපාක සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ වර්ධනය සහ ඇබ්බැහිකාරී තත්ත්වය මත වෙනස් වන බවයි. ඒ අනුව එය ප්‍රධාන කරුණු කිහිපයක් යටතේ පෙන්වා දීමට හැකිය.

1. සමාජ අපකීර්තිය (Social Stigma) - මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් සමාජය තුළ අපකීර්තියට ලක් වන්නේ, ඔවුන් පවුල තුළ මවක්, බිරිඳක් හෝ වෙනත් භූමිකාවකට පටහැනි ක්‍රියාවක් ලෙස සිදු කරන ක්‍රියාවක් බැවින් සමාජය තුළ අපකීර්තියට ලක් වීම

2. සමාජ සහාය අඩු වීම - පිරිමින්ට සාපේක්ෂව සමාජය තුළින් කාන්තාවට සහාය අහිමි වීම මෙහිදී පෙන්වා දිය හැකිය. දැනටමත් පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පවුල්වල කාන්තාවන් සහ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින කාන්තාවන් සඳහා සමාජය තුළ අඩු සහායක් හිමි වීමක් හඳුනා ගත හැකිවීම

3. සමාජ හා ආර්ථික දුෂ්කරතා - කාන්තාවන් බොහෝ විට අඩු ආදායම් රැකියාවල නිරත වීම තුළ ඔවුන් අවදානම් වීම ඉහළ මට්ටමක් පවතින බැවින් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා යොමු වීමේ ඉඩකඩ වැඩි වීමක් හඳුනා ගත හැකිය. එසේම මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ කාන්තාවන් පවා අඩු ආදායම් හෝ පහළ ආදායම් මට්ටමක් හඳුනාගත හැකි බැවින් එය ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු වීමට ද බාධාවන් සේ පවතී.

4. මත්ද්‍රව්‍ය භාවිත සහකරුවන්ගේ බලපෑම - කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ආරම්භය සඳහා තම සහකරුගේ බලපෑම ප්‍රධාන හේතු සාධකයක් බවට පත්ව තිබෙන බව පර්යේෂණ තුළින් අනාවරණය කර ඇත. එපමණක් නොව මත්ද්‍රව්‍ය භාවිතය පවත්වා ගෙන යාමත්, නැවත නැවත භාවිතයට යොමු වීමත් යන්න ද හඳුනා ගත හැකිය.

5. ප්‍රචණ්ඩත්වයට හා ආසාදන වලට ලක් වීම - කාන්තාව සාමාන්‍ය සමාජය තුළ විවිධ ප්‍රචණ්ඩත්වයන්ට භාජනය වන තැනැත්තියක් ලෙස හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ කාන්තාවන් ද විවිධ කායික, මානසික සහ ලිංගික ප්‍රචණ්ඩත්වයන්ට ලක් වන බව පෙන්වා දිය හැකිය.

සේනානායක ඇතුළු කණ්ඩායම 2019 දී ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ප්‍රවණතා සහ රටා පිළිබඳව සිදු කළ පර්යේෂණයට අනුව කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට බලපෑ හේතු අතර 10 (7%) දෙනෙක් තම සැමියාගේ බලපෑම මත හෙරොයින් භාවිතයට යොමු වී ඇති බව අනාවරණය කර ඇත. තවද පර්යේෂණ අත්දැකීම් අනුව සිය ස්වාමියා විසින් තම බිරිඳ වෙනත් පුරුෂයින්ට ලිංගික ශ්‍රමිකයින් ලෙස විකුණා මුදල් ලබා ගැනීමට පෙළඹී ඇත. එහිදී කාන්තාව වෙනත් පුරුෂයින් සමඟ ලිංගික සම්බන්ධතා පැවැත්වීම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කිරීමට ද, ප්‍රචණ්ඩත්වයට ලක් වීම ද සිදු වී තිබෙන බවට අනාවරණය වී ඇත.

මේ අනුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය තත්ත්වයන් මත කාන්තාවට සමාජය තුළ සමාජයීය වශයෙන් ජීවත් වීමේ දී යම් යම් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී තිබෙන අතර ඒ නිසාම කාන්තාව ආන්තීකරණයට ලක් වූ තැනැත්තියක් වශයෙන් හඳුනා ගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම ද පුද්ගලික සාධකයට එහා ගිය සමාජ සාධකයක් බවට පත් වී තිබෙන බව සඳහන් කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

සේනානායක,බී.(2019),*කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා සහ නූතන ප්‍රවණතා*,අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,රාජගිරිය.

European Monitoring Centre for Drugs and Drug Addiction, *Gender and Drug*, https://www.emcdda.europa.eu/topics/women_en

National Institute on Drug Abuse, *Sex and Gender differences in Substance Use*, https://nida.nih.gov/publications/research-reports/substance-use-in-women/sex-gender-differences-in-substance-use.

නිලානි රේණුකා
පර්යේෂණ නිලධාරී

## නීතිවිරෝධී මත්පැන්, ග්‍රාමීය පවුල් ඒකක කෙරෙහි බලපෑම් කරන ආකාරය.

නීතිවිරෝධී මත්පැන් භාවිතය ලංකාව පුරා පැතිරී ඇති ගැටලුවක් ලෙස හඳුනා ගත හැකි වන අතර නාගරික ප්‍රදේශ වලින් බැහැර වූ විට ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ එම තත්ත්වය වඩා ප්‍රබලව දැකගත හැකි වේ. බොහෝ විට නීතිවිරෝධී මත්පැන් භාවිත කරන්නන්ගෙන් බහුතරය ඊට ඇබ්බැහියක් දක්වන්නේ ඒවායෙහි අඩංගු මද්‍යසාර ප්‍රමාණය අධික වීමත්, දෛනිකව වැඩි ප්‍රමාණයකින් බීමට පෙළඹීමත් හේතුවෙනි. මේ තත්ත්වය මත ග්‍රාමීය ප්‍රදේශවල භාවිතයට පෙළඹී සිටින බොහෝ පිරිමි පුද්ගලයන් නීතිවිරෝධී මත්පැන් කෙරෙහි ඇබ්බැහියක් සහිත පුද්ගලයන් වශයෙන් හඳුනා ගත හැක.

ගම්මානවල මත්පැන් නීතිවිරෝධී ලෙස පෙරා ගැනීමට අවශ්‍ය කරන සහයෝගී පාරිසරික තත්ත්වයක් පැවතීමද මේවා වැඩි වශයෙන් ව්‍යාප්ත වීමේ හේතු අතර මූලික වෙයි. ඇළ දොළ, ගංගාවන් වල ඉවුරු වල ගලා යන ජලය සහිත පරිසරයත්, කැළෑ බද ප්‍රදේශ වැඩි වශයෙන් පැවතීමත් මෙම කාර්යයට පහසු වෙයි. එසේම ග්‍රාමීය ක්ෂේත්‍රය තුල පවතින සාමාජයීය පරිසරයත් ඊට රුකුලක් නොවේ යැයි බැහැර කළ නොහැක. බොහෝ පුද්ගලයන් කුඹුරු ගොවිතැන, හේන් ගොවිතැන ඇතුළු ගොවිතැනින් ජීවිකාව ගත කරන අතර, තවත් පිරිසක් කුලී රැකියාවල නිරත වේ. තවත් පිරිසක් සිය නිවෙස් වලම කුඩා ප්‍රමාණයේ කර්මාන්තයන් සිදු කරන බැවින් ඔවුන්ගේ වැඩ පරිසරය තුළ බොහෝ විට කාර්යබහුල වන්නේ උදෑසන වරුවේ පමණි. ගොවිතැන ඉන් විශේෂ වන අතර අනෙකුත් රැකියාවන් ද සවස් වරුවේ බොහෝ විට නිදහස් වේලාවන් නිර්මාණය කර තිබේ. ඒ හේතුවෙන් සවස් වරුවට මත්පැන් බීමට එක් රැස් වීමේ වැඩි ශක්‍යතාවයක් පවතී. එසේම ගම්මාන තුළ සියලු දෙනාම නෑදෑයන් හෝ දන්නා හඳුනන පිරිස් වීම නිසාවෙන් මෙම එකමුතුවේ ප්‍රමාණය තව දුරටත් ඉහළ යයි. ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ කාන්තාවන් බොහොමයක් රැකියා නොකරන ගෘහනියන් වීමත්, පහළ අධ්‍යාපන මට්ටමත් හේතුවෙන් යම් ආකාරයක ගෘහය තුළ පිරිමියාගේ ආධිපත්‍යයට නතු වීමක් දක්නට ලැබේ. ඒ හේතුවෙන් ගෘහ මූලිකයා ලෙස පිරිමියාට උපදෙස් දීමට හෝ එදිරිව යාමට ඇති හැකියාව බොහෝ සෙයින් අවම වීම මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කරයි. එසේම ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ එදිනෙදා ජීවිකාවන් වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර මාසික වැටුප් නොලබන ඔවුන් දෛනිකව මුදලක් ලබයි. මේ හේතුවෙන් බොහෝ විට සවස් යාමයේ මත්පැන් බීමට මුදලක් ඔවුන්ට සපයා ගැනීමද අපහසු නොවේ. ඊට අමතරව මත්පැන් පෙරීම සිදු කරන්නන් බොහෝ විට ඔවුන් වටා බලයක් ඒකරාශී කර ගැනීම අති සාමාන්‍ය සිද්ධියක් ලෙස හඳුනා ගත හැකි වේ. එය යම් ආකාරයක පිරිස් බලයක් සමග එකතු වූ චණ්ඩිකමක් හෝ ග්‍රාමීය දේශපාලකයා හිතවත් කර ගැනීම හෝ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හිතවත් කර ගැනීමක් හෝ විය හැකිය. මේ තත්ත්වය මත නීතිවිරෝධී ලෙස මත්පැන් පෙරීම හෝ විකිණීමට විරුද්ධව පුද්ගල හෝ කණ්ඩායම් මට්ටමින් බලපෑම් කිරීමේ හැකියාව ද ඇහිරී ඇත.

ඉහත කී තත්ත්වයන් සියල්ලේ එකතුව විසින් පොදු බලපෑම සිදු කර ඇත්තේ ග්‍රාමීය කුටුම්භයට වීම ප්‍රබලම හානිදායක තත්ත්වය වේ. සෑම දිනකම බීමත්ව පැමිණෙන පුරුෂයන් හේතුවෙන් ගම්මානවල ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැඩි ලෙස ඉහළ ගොස් ඇත. අවදානම් සහගත කණ්ඩායම ලෙස

කාන්තාව හා කුඩා දරුවන් මේ තත්ත්වයෙහි පීඩිත ගොදුර බවට පත් වී ඇත. බීමත්ව පැමිණ බිරිඳට පහර දීම පුරුද්දක් කරගෙන සිටින සමහර පුරුෂයන් හේතුවෙන් කාන්තාවන් ශාරීරික පීඩා වල සිට සදාකාලික දුබලතා ඇති වන තත්ත්වයට පත්වන තුරු පීඩාවන්ට ලක් වූ සිදුවීම් දක්නට ලැබේ. එසේම ඇයගේ ගෞරවය අහිමි වී යාම, ආදරය, ආරක්ෂාව අහිමි වීම, බලාපොරොත්තු කඩ වීම හේතුවෙන් දැඩි ලෙස මානසිකව ක්ලමථකාරීත්වයට පත් වීමත්, සමහර අවස්ථාවන් හි දී මානසික අවපීඩන තත්ත්වයන් ට ගොදුරු වීමත් දක්නට ලැබේ. නිසි ලෙස ආහාර හා පෝෂණය නොලැබීම, ඇඳුම් පැළඳුම් හා විවේකය, විනෝදය, මානසික සුවය අහිමි වීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය දැඩි ලෙස පහත වැටී ඇත. බීමත්කම කුටුම්භයේ ආර්ථික මට්ටමද බිංදුවට ඇද දමන බැවින් කාන්තාවන් ට පවුලේ ආර්ථික බරපැණ දැරීමටද සිදු වන අවස්ථාද බහුලය. මෙහි දිගුවක් ලෙස කාන්තාවන් කුලී රැකියා හෝ නගරාශ්‍රිතව ඇඟලුම් ක්ෂේත්‍ර ආදියට යොමු වීමේ සිට ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වීමේ තත්ත්වයද දැකගත හැකි වේ. මේවායෙහි අනිසි විපාක බහුල වශයෙන්ම දරුවන්ට විඳින්නට සිදුව ඇති අතර සමස්ථයක් වශයෙන් කුටුම්භයේ සමබරතාවය ගිලිහී ගොස් බිඳුණු පවුල් නිර්මාණය වීම මෙහි සෘජු ප්‍රතිඵලය ලෙස හඳුනාගත හැකිය.

මීට අමතරව කාන්තාවන් විවාහය තුළ පීඩාවට ලක් වීම කරණකොට ගනිමින් තරුණ කාන්තාවන් විවාහය අතහැර යාමට තීරණය කිරීම ඇය සමාජය තුළ තවදුරටත් අනාරක්ෂිත තත්වයට ඇද දමා තිබේ. විවාහය තුළ අපේක්ෂිත රැකවරණය, සෙනෙහස, ආදරය වැනි අති මානුෂීය තත්ත්වයන් අහිමි වී යාම මත කාන්තාවන් අනියම් සබඳතා වලට පෙළඹීම ගැටලුකාරීත්වය දෙගුණ තෙගුණ කිරීමට සමත් වී ඇත. අනියම් සබඳතා හෙළිදරව්වීම මත ඇතිවන ගැටුම් වලදී, සමාජ අගෞරවය, හංවඩු ගැසීම් වලට අමතරව තුවාල සිදුවීම්, මිනී මැරීම් හා සිය දිවිනසා ගැනීම්, ජීවිත හානි දක්වා මෙම තත්ත්වයන් දුර දිග ගොස් තිබේ. එසේම නිවසේ ස්වාමියාගේ නිරන්තර බීමත්කම නිසා ඔහු දුර්වලයෙක් ලෙස දකින වෙනත් පුරුෂයන් විවාහක කාන්තාවන්ට බලපෑම් කිරීම, ලිංගික වහලියන් බවට පත් කර ගැනීම ආදී සිදුවීම් මගින් කාන්තාවන් සමාජය තුළ අනාරක්ෂිත වීමේ සිදු වීම් ද ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ බහුල වශයෙන් දැකගත හැකි වේ.

තවද විදේශ ගත වන කාන්තාවන් තම හාම්පුතුන් අතින් විවිධාකාරයේ අඩන්තේට්ටම් වලට ලක් වන අතර, සදාකාලික අබ්බගාත තත්ත්වයට පත් වී මුදල්ද අහිමිව නැවත මව් රටට ඒමට සිදු වූ අවස්ථාවන් ඇත. එම රටවලදීම වද බන්ධන වලට ලක් වී ශ්‍රී ලාංකීය කාන්තාවන් මිය යාමේ සිදු වීම්ද පසුගිය දශක ගණනක සිට විවිධාකාරයෙන් අසන්නට දකින්නට ලැබේ. විදේශ ගත නොවුණ ද කම්හල් වලදී, වැඩ බිම් වල දී ශ්‍රම සූරා කෑම් වලට අමතරව ලිංගික අල්ලස් ලබා දීමට සිදුවීම් ද රහසේ සිදුවන වාර්ථාගත නොවන පීඩාවන් ලෙස බහුල වශයෙන් දැකිය හැකි වේ. ස්වාමියා බීමත් කමට ඇබ්බැහි වූ පවුලක කාන්තාවක් බව දැන ගැනීමම, ඇය තෙවන පාර්ශවයකට කුමනාකාර හෝ පීඩාවකට ලක් කිරීම පහසුය, යන ප්‍රතිරූපය සමාජය තුළ ගොඩ නැගී තිබීම හේතුවෙන් කාන්තාව සමාජ අනාරක්ෂිත බවේ ගොදුරක් බවට පහසුවෙන්ම පත් වීමට ඇති ඉඩ කඩ වැඩිය.

එසේම බීමත් පුරුෂයෙකුට බිරිඳ වන කාන්තාවක් ගර්භනී සමයේ මුහුණ දෙන  පීඩාවන් හේතුවෙන් හදිසි ගබ්සා වීම් වල සිට කායිකව හා මානසිකව රෝගී දරුවන් බිහි කිරීමටද හේතුවක් වේ. සමහර අවස්ථා වලදී ඇතිවන හදිසි බිළිඳු මරණ, ඉන්ද්‍රිය අවයව නිසි ලෙස වර්ධනය නොවූ දරුවන් මෙන්ම අධි ක්‍රියාකාරීත්වය වැනි මානසික වශයෙන් අක්‍රමතා සහිත දරුවන්ගේද මුල් සොයා ගියහොත් බීමත් පියෙකු යන සාධකය අනෙකුත් හේතුන්ට වඩා ඉදිරියෙන් තිබෙන ආකාරය දැකගත හැකි වේ. ග්‍රාමීය නීතිවිරෝධී මත්පැන් කෙරෙහි ඇබ්බැහි වූ

පියෙකු සහිත කුටුම්භයක මැනිය නොහැකි බේදවාචකයකට එම කුටුම්භයන්හි දරුවන් ලක්වීම දක්නට හැකියි. පියාගේ බීමත්කම මව් කුසේ සිටින දරුවාගේ සිට වැඩිහිටිවියට පැමිනි දරුවන් වන තෙක්ම සිදු කර ඇති බලපෑම සුළු පටු නොවේ. පියා බීමත්ව නිවසේ වියදමට වන මුදල් විනාශ කිරීම දරුවන්ගේ එදිනෙදා ආහාර පාන ඇඳුම් පැළඳුම් වැනි මූලික අවශ්‍යතා අහිමි කරන අතර මන්දපෝෂණය හා දුශ්පෝෂණය සහිත දරුවන් ඒ හරහා නිර්මාණය වේ. එම තත්ත්වය කායිකව මෙන්ම මානසිකවද විශේෂ අවශ්‍යතා සහිත දරුවන් නිර්මාණය වීම කෙරෙහි බලපෑම් කර තිබේ.

දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම මෙහි දක්නට ලැබෙන වඩා බේදජනක තත්ත්වය වෙයි. හේතු රාශියක් මත, මෙසේ පියා බීමත් ග්‍රාමීය පවුල් වල දරුවන්, පාසල් අධ්‍යාපනය තුළින් වියුක්ත වන ආකාරය දැකගත හැකි වේ. විශේෂයෙන් පොත් පත් පාසල් උපකරණ, සපත්තු, ඇඳුම් පැළඳුම් සපයා ගැනීමේ දීර්ඝකාලීන අපහසුතාවය මත දරුවන් පාසල් නොයාමට තීරණය කරයි. එසේත් නැතහොත් නිවසේ පවතින ගැටුම්කාරී තත්ත්වය විසින් දරුවන් කෙරෙහි ඇති කරන මානසික කම්පනය, ඉගෙනුම් අක්‍රමතා ඇති කිරීමට හේතු සාධක වන බැවින් පාසලේ වැඩ කටයුතු කරගෙන යාමට අවශ්‍ය අවධානය, ධාරණ ශක්තිය ඔවුන්ට අහිමි වේ. ඒ හේතුවෙන් විභාග අසමත් වීම මත පාසල් වලින් ඉවත් වීමට දරුවන් පෙළඹේ. එසේම තවදුරටත් විමර්ශනාත්මකව බැලීමේ දී බීමත් පියා හේතුවෙන් මවට වන සාමාජයීය බලපෑම, පාසලේදී සමවයස් කණ්ඩායමේදී ඇති වන හංවඩු ගැසීම් හේතුවෙන් ඇතිවන ලැජ්ජාව හා සමාජ පීඩනය හේතුවෙන් ද දරුවන් පාසල් අධ්‍යාපන අතහරින ආකාරය දැකගත හැකි වේ.

නගරබදව මෙන් දරුවන් පාසල අතහැරීම පිළිබඳව ග්‍රාමීය සමාජයේ අවධානය යොමු නොවීම හේතුවෙන්ම නිදහසේ පාසල් අධ්‍යාපනය අතහැරීමට දරුවන් පෙළඹී සිටී. අනෙක් අතට මෙසේ අඩු වයසින් පාසල් අතහරින පිරිමි දරුවන් ගම්මානවලම ගොවිතැනට හෝ කුලී ශ්‍රමිකයන් බවට පත් වන අතර නගර වලට සංක්‍රමණය වන්නන්ගේ තත්ත්වය වඩා දරුණු වේ. ඔවුන් අඩු වයසින් ශ්‍රමිකයන් ලෙස අවම වේතනයකට ශ්‍රම සූරා කෑමට ලක්වීම මෙන්ම, ලිංගික අපචාර, මත්ද්‍රව්‍යය ඇබ්බැහිය ඇතුළු දුරාචාර ක්‍රියාවන්ට යොමු වීමට සිදුවීමද, විශේෂයෙන් දැකගත හැකි වේ. මෙසේ ශ්‍රමිකයන් බවට පත්වන ගැහැනු ළමුන්ගේ තත්ත්වය පිරිමි ළමුන්ට සාපේක්ෂව වඩාත් දරුණු මට්ටමකට පත් වේ. කම්හලක වැඩ බිමක ශ්‍රම සූරා කෑමට ලක් වීමේ සිට ඔවුන් සම්බාහන මධ්‍යස්ථාන, වැනි ස්ථානවලට සේවයට යොමු වීමෙන් අවසානයේ ගණිකා වෘත්තියට යොමු වීමේ සිදු වීම් ද සුලභව දක්නට ලැබේ. එසේම මත්ද්‍රව්‍ය වල ගොදුරු බවට පත්වීම, විවිධාකාරී විෂමාචාරී ක්‍රියා වලට ලක් වීම හේතුවෙන් ඔවුන් සිය ගම්බිම් වලට නැවත නොගොස් එම පීඩාකාරී ජීවිතයම ගත කරමින් නාගරික ජීවිතයට හුරු වන ආකාරය දැකිය හැකි වේ.

ග්‍රාමීය පවුල්වල මව විදේශගත වීම මත දරුවන් බීමත් පියා සමග නිවසේ තනිවීම හේතුවෙන්, වැඩිහිටි වයසේ ගැහැනු ළමුන් මෙන්ම කුඩාම වයසේ ගැහැනු ළමුන් පවා සිය පියාගේම ලිංගික ගොදුරු බවට පත් වීම පසුගිය කාලය පුරාවටම වාර්ථා වූ සිදුවීම් හරහා දැකගත හැකි වේ. ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ මෙවන් සිදුවීම් වාර්ථා වන ප්‍රමාණයට වඩා වාර්ථා නොවන ප්‍රමාණය අධික වේ. මව විදේශගත නොවුණද මව නිවසේ සිටියදී පවා බීමත් පියා අතින් දූෂණය වන ගැහැනු දරුවන්ගේ ප්‍රමාණය වාර්ථා වන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වේ.

එසේම පියා බීමත් පවුලක ගැහැණු පිරිමි දරුවන් සියල්ලම සමාජයට අනාරක්ෂිත වන විට ආසන්නතම නෑයන් විසින් අපහරණය කරන දරුවන් ද ග්‍රාමීය පවුල් ආශ්‍රිතව දැකගත හැකි වේ. මෙවැනි සිදුවීම් ප්‍රකාශ කරගැනීමට අපොහොසත්ව

පීඩාව අභ්‍යන්තරීකරණය වීම හේතුවෙන් පසු කාලීනව පෞරුෂ ආබාධ, ලිංගික අක්‍රමිතා, අපරාධ හා අපචාරී චර්යාවන් සහිත පුද්ගලයන් බිහි වීම දීර්ඝකාලීන ගැටලු වශයෙන් ඉස්මතු වෙයි. නිවසේ ගැටලුකාරී තත්ත්වය මත අඩු වයස් විවාහ වලට පත්වන දරුවන් විසින් නොමේරූ දරුවන් බිහි කිරීම, උපත් පාලනයෙන් තොරව බිහිකරන විශාල ප්‍රමාණයක් වූ දරුවන් හේතුවෙන් වන ආර්ථික අහේනිය සහිත පවුල් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ බහුල වශයෙන් දැකගත හැකි වේ.

මීට අමතරව පියාගේ බීමත්කම හා පීඩාවන් හේතුවෙන් දරුවන් විසින් පියා ඝාතනය කිරීම, බිරිය විසින් සැමියා ඝාතනය කිරීම වැනි සිදුවීම් ද දැකගත හැකි වන අතර සමහර අවස්ථා වලදී සියදිවි නසා ගැනීමට තීරණය කිරීම් වඩාත් දරුණු වන්නේ බීමත් පියාට දරුවන් පවරා මිය යාම විනාශයක් ලෙස දකින මවුවරුන් සිය දරුවන්ටද විෂ පානය කිරීමට සලසා සියල්ලන්ම එක වර දිවි තොර කර ගැනීමයි. මෙවැනි ඛේදජනක තත්ත්වයන් රූපවාහිනියෙන් දකින් විට ඒ පිළිබඳව කථාබහක් නිර්මාණය වුවද සිදුවීම් වල උණුසුම පහව ගිය විට නමුත් ග්‍රාමීය සමාජය අඛණ්ඩව පැවතෙන්නේ මෙම ගැටලු ප්‍රමාණයත් සමගම මිස කිසිඳු විසඳුමකට යාමේ යාන්ත්‍රණයකින් තොරව වීම කණගාටුවට කරුණ වේ. සමහර අවස්ථාවලදී නීතිවිරෝධී මත්පැන් විෂ වීම් වලට ලක් වීමෙන් එකවර පිරිසක් මාරාන්තික ව රෝගී වීම හෝ මිය යාමේ සිදුවීම් පවා මේ ආශ්‍රිතව දැකගත හැකි විශේෂ අවස්ථාවන් ලෙස සඳහන් කළ හැකි වේ.

දරුවන්ගේ භූමිකා රංගනයනයේ මුල් ගුරුන් මව පියා ඇතුළු පවුල වන අතර මූලික සමාජානුයෝජන ඒකකය වන්නේද පවුලයි. එබැවින් බීමට ඇබ්බැහි වූ, නිවසේ ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන, ආධිපත්‍යධාරී පියෙකුගේ පුතකු, පිරිමියෙකුගේ භූමිකා රංගනය ලෙස කුඩා කල පටන් අභන්තරීකරණය කර ගන්නේ එම තත්ත්වය නිසාවෙන් වැඩිහිටි වයස එළඹී විට තමාගේ භූමිකාව ද එයම බවට පත් කර ගැනීම වැළැක්විය හැකි නොවේ. එසේම ගැහැනු ළමුන් විසින් සිය භූමිකාව යනු නිරන්තර පීඩාවන් දරා ගැනීම, අධ්‍යාපනය නොලැබීම, දරුවන් බිහි කිරීම, විවාහය තුළ පීඩාවන්ට නිරාවරණය වීම යනාදිය පමණක් බව අභ්‍යන්තරීකරණය කර ගැනීමත් සමග ස්වාධීන චින්තනයක් සහිත බුද්ධිමත් උගත් කාන්තාවන් බිහි වීම කිසිසේත්ම බලාපොරොත්තු විය නොහැක.

නීතිය ක්‍රියාත්මක කරන අංශ විසින් සිය රාජකාරිය අකුරට ඉටු කිරීමත්, නීතිවිරෝධී මත්පැන් ජාවාරම්කරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් වටා තිබෙන විවිධාකාරයේ බලයන් යටපත් කිරීමට හැකි ආකාරයේ දීර්ඝ කාලීන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමත්, ඒවා නිරන්තර ආවේක්ෂණය කිරීමත්, ග්‍රාමීය ක්ෂේත්‍රය අධ්‍යාපන මට්ටම දියුණු කොට පාසල් හැර යන්නන්ගේ ප්‍රමාණය අවම කිරීමත්, ඔවුන්ට උසස් අධ්‍යාපනය හා වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනයට යොමු වීමට ඇති ඉඩකඩ පුළුල් කිරීමත්, ග්‍රාමීය කාන්තාවන් බල ගැන්වීමේ දීර්ඝකාලීන යාන්ත්‍රණයන් ක්‍රියාවට නැංවීමත් මෙම ගැටලුවේ චක්‍රය බිඳ දැමීමට හැකි දිගු කාලීන යෝජනා ලෙස දැක්විය හැකි වේ. ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ වන නීතිවිරෝධී මත්පැන් ඇබ්බැහිය සමස්ත සමාජයේම පැවැත්මට බලපෑම් කරන්නාවූ සාධකයක් ලෙස සැලකීම එය සමාජයෙන් බැහැර කිරීමට උපස්තම්භකයක් වේ.

තුෂාරි වලස්මුල්ලගේ

සහකාර පර්යේෂණ නිලධාරී

# තිරසාර හෙටක් උදෙසා අද දින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය

"තොටිල්ල පදවන අත ලොව පාලනය කරයි " නැපෝලියන් විසින් ප්‍රකාශිත මෙම ප්‍රකාශනය ලෝක ප්‍රකට වූයේ හුදෙක් එය සිත්ගන්නාසුළු ප්‍රකාශයක් වන නිසාවෙන් නොව ඒ තුළ ගැබ්ව ඇති ප්‍රබල හරය නිසාය. කාන්තාවක් සතු ශක්තිය හා ප්‍රභවතාවය එක් වාක්‍යයකට ගොනු කරන ලද එක් ඓතිහාසික ප්‍රබල අවස්ථාවක් ලෙස මෙම කෙටි ප්‍රකාශනය දැක්විය හැකිය. කාන්තාව යනු, බහුවිධ භූමිකාවක් (Multiple role) නිරූපණය කරනු ලබන තැනැත්තියකි. කාන්තාවකට ලෝකය නිර්මාණය කිරීමට, එයට ජීවය දීමට බලය ස්වභාවධර්මය මඟින් දායාද කිරීමේ පටන් ලොව මෙහෙයවන ගාමක බලවේගය බවට පත්වීමේ හැකියාව පවතී. කාන්තාව සතු භූමිකාව හා කාර්යභාරය (Status and Role) ක්‍රමිකව ඇති වූ සංක්‍රාන්තිමය ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකිය. මෙහි තත්ත්වයන් එක් එක් සමාජයෙන් - සමාජයට, රටින්- රටට, කලාපයෙන් - කලාපයට විවිධාංගීකරණය සහ විශේෂීකරණය වී පැවතීම ලක්ෂණයයි. සමස්තයක් ලෙස කාන්තාවක් විසින් අද දින පණ පොවනු ලබන භූමිකාවන් සහ කාර්යභාරය සඳහා අවශ්‍ය විභවතාවයන්, ශක්‍යතාවයන් අවදි කරගෙන තිබෙන්නේ කාන්තාව විසින්ම බව ඇයගේ කාර්යය කොටස් මඟින් මනාව පෙනී යනු ලබයි.

"තිරසාර හෙටක් උදෙසා අද දින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය" - "Gender equality today for a sustainable tomorrow" 2022 වර්ෂයේ ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව ලෙස එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත්කර ඇත්තේ මෙම තේමාවයි. එනම් ගෝලීයව ස්ථාවර සංවර්ධන ඉලක්ක කරා යාමටත් , ඒවා සම්පූර්ණ කරමින් ගෝලීයව සංවර්ධනය වූ එක් ලෝකයක් බිහිකිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමට නම් ස්ත්‍රී - පුරුෂභාවය පදනම් කරගනිමින් වෙනස්කම් හෝ සීමාවන් පැනවීමකින් තොරව දෙපාර්ශවයටම සමාන්තරව සංග්‍රහ කරමින් කටයුතු කිරීමය. මේ වන විට ලෝකයේ බොහෝ රටවල් තුළ මෙම සංකල්පීය ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක වීමක් පවතින අතරම පුද්ගලයා ගෝත්‍රික මානසිකත්වයෙන් මිදී තමා - තමා තුළින්ම ස්වාධීන වීමට ගන්නා උත්සාහයේ ප්‍රතිඵල මත මෙය තීරණය වීම සිදුවේ. එනම් කාන්තාව හෝ පුරුෂයා යන දෙපාර්ශවය මත පදනම්ව වෙනස් සැලකීමක් සිදු කරනවාද? විශේෂතාවයක් මත කටයුතු කරනවාද? යන්න තීරණය වන්නේ තම මනස තුළම ් සිටින ගෝත්‍රික මිනිසා තුළින් බව ප්‍රකාශ කළ හැකිය. මන්දයත් සමස්ත ලෝකය ගෝලීයව එක් ඒකකයක් කරා සංවර්ධනය වන මට්ටමක් තුළ දී විශාල ලෙස විද්‍යාව සහ තාක්ෂණය පදනම් කරගත්, සාක්ෂරතාවය ඉහළ තත්වයක් කරා පැමිණ තිබෙන වාතාවරණයක් තුළ ජනවාර්ගිකත්වය, කුලය, හමේ වර්ණය හෝ සමාජ පන්තිය වැනි සාම්ප්‍රදායික මෙවලම් සඳහා තිබූ ප්‍රමුඛතාවයන් ක්‍රමිකව වියැකී යන වාතාවරණයක ස්ත්‍රී -පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් මත පදනම්ව කටයුතු කිරීම ගතානුගතික, සාම්ප්‍රදායික මිනිසා පිළිබිඹු කිරීමක් වේ.

මේ වන විට ගෝලීය ප්‍රවාහය තුළ කාන්තාවන් සිය ගෘහය කළමණාකරණය, පාලනය කිරීමේ සිට ලොව පාලනය කිරීමේ තාක්ෂණික ශක්‍යතාවයන්ගෙන්ද යුක්ත වීම ලක්ෂණයයි. කාන්තාව සතු මෙකී. ශක්තිමත් හැකියාවක් තුළ කාන්තාව සමාන්තර අවස්ථා ලැබීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබේ. නමුත් තවදුරටත් විවිධ සාම්ප්‍රදායික හෝ

ගතානුගතික එළඹුම් මත පදනම්ව කාන්තාවට ස්වාධීනව කටයුතු කිරීමේ අවස්ථාවන් අහුරා දැමීම එම සමාජයන්හීම තිරසර හෙට දිනය අඩාල කිරීමට හේතු වනු ඇත.

එසේම කාන්තාව පුරුෂයා යන විභේදායනයෙන් තොරව පුරුෂයා හා සමගාමීව සමාන්තරව යමින් කාන්තාවද තම භූමිකාව හා කාර්ය කොටස ඉටු කරනු ලබයි. සමාජ විද්‍යාත්මක විග්‍රහයන් විසින් පෙන්වා දෙන්නේ කාන්තාව "ද්විත්ව භූමිකාවක්" ඉදිරිපත් කරන බවයි. එනම් ඒ තුළ තවදුරටත් විශ්ලේෂණය කර බැලීමේ දී පෙනී යන්නේ බහුවිධ කාර්යය කොටස් ඒ තුළ අන්තර්ග්‍රහණය වන බවයි. සමාජයේ මූලිකම සමාජ ඒකකය වන "පවුල" තුළ ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටු කරන ඇය ආර්ථිකව ඉපයන්නියක් වෙමින් තම විභවතාවය ප්‍රායෝගික කාලය තුළ ඔසවා තැබීමට තරම් ශක්තිමත් වන්නීය.

තිරසර සංවර්ධන ඉලක්කයන් හා එහි දර්ශක ඔසවා තැබීමට අවශ්‍ය භෞතික, මානසික, ආර්ථික, සමාජයීය යනාදි සෑම අංශයකම ප්‍රාගුණ්‍යකින් හෙබි ඇය මේ වන විට නිරායාසයෙන් සමාන්තර අවස්ථාවන් ලැබීමට කටයුතු සම්පාදනය කර තිබේ.

ලෝකයට නව ජීවයක් දෙමින් මවකගේ භූමිකාව තුළ ගෞරවාන්විත මෙහෙයක් ඉටු කරන ඇය, සහෝදරියක, දියණියක, මිත්තණියක, ව්‍යවසායිකාවක යනාදී ලෙස විශාල පාරාසයක් පුරා විහිදුණු නිර්මාණශීලී කාර්යභාරයක වගකීම උසුලන්නීය.

එසේනම් එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන පරිද්දෙන්ම තිරසර හෙට දවසක් උදෙසා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය එනම්, ස්ත්‍රිය හෝ පුරුෂයා යන කඳවුරු දෙක මත පදනම්ව පටු පරාසයක නොදිවෙන තත්ත්වයක් විය යුතු බවය.

ජයනි රණසිංහ

සහකාර පර්යේෂණ නිලධාරී

## මිනිස් මොළයේ අර්ධගෝල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මනෝවිද්‍යාත්මක විමසුමක්.

මානවයාගේ පරිණාමීය ක්‍රියාවලියේ දී මේ දක්වා එක් එක් අවධි ඔස්සේ විවිධ ස්වරූපයෙන් මිනිස් මොළය වර්ධනය වූ බව ජීව විද්‍යාඥයින්ගේ පර්යේෂණ මත නිගමනය කළ හැකිය. ඒ ආකාරයට විකාශය වූ මිනිස් මොළයේ නූතන ක්‍රියාකාරිත්වය දෙස විමසා බලන විට ප්‍රධාන වශයෙන් අර්ධගෝල දෙකකට බෙදා දක්වනු ලබයි. එනම්, වම් අර්ධ ගෝලය (Left hemisphere) සහ දකුණු අර්ධ ගෝලය (Right hemisphere) ලෙසය. මෙහිදි වම් අර්ධ ගෝලය මඟින් ශරීරයේ දකුණු ප්‍රදේශය ද දකුණු අර්ධ ගෝලය මඟින් ශරීරයේ වම් ප්‍රදේශය පාලනය කරනු ලබයි. මෙය පරිණාමයේ අපූරු දායාදයකි. එය විස්තර කළ නොහැක්කකි. යම් කිසි කෘත්‍යයක් ගතහොත් එම කෘත්‍යයේ පාර්ශ්වීකරණය (lateralization) හා ප්‍රාදේශීකරණය (localization) යන කාර්යයන් දෙකම සිදු කරන අවයව මොළයයි. මේ ආකාරයට මිනිස් මොළයේ අර්ධගෝල ක්‍රියාකාරීත්වය සහ ව්‍යුහාත්මක

වෙනස්කම් පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයක් මෙම ලිපිය තුළ ගැබ්ව පවතී.


පරිණාමීය යුගයේ සිට මේ දක්වා වූ මිනිස් මොළය එක් එක් අවධියේ දී විවිධ ස්වරූපයෙන් වර්ධනය වී ඇත. එනම් හැබිලිස්ගේ සිට හෝමෝ සේපියන් සේපියන් දක්වා මෙම වර්ධනය සිදු වූ බව විද්‍යාඥයෝ සඳහන් කළහ. ජීව විද්‍යාඥයින්ගේ පර්යේෂණ මත මිනිස් මොළයේ ඇති සුවිශේෂීත්වය තහවුරු වූ අතර, එම සුවිශේෂීත්වය කෙරෙහි අර්ධගෝල ක්‍රියාකාරීත්වය බලපාන බව සඳහන් වේ. මොළය වම් හා දකුණු මස්තිෂ්ක අර්ධ ගෝල වලින් සමන්විතය. කායික විද්‍යානුකූලව එය බාහිකය (CORTEX) හා මජ්ජාව හෙවත් මිදුලුව(MEDULLA) යන කොටස් දෙකකට වෙන් කළ හැක. බාහිකය ස්නායු සෛල වලින් යුක්ත වන අතර මජ්ජාව අක්සන වලින් ද යුක්තය. ස්නායු සෛලයක් තවකෙකට සම්බන්ධ වන්නේ අක්සන මගිනි. මොළයේ ඉදිරිපස කොටස ලලාට ඛණ්ඩිකාව (FRONTAL LOBE)නමින්ද පිටුපස කොටස අපර කපාල ඛණ්ඩිකාව (OCCIPITAL LOBE) නමින්ද හැඳින්වෙන අතර දෙපස පිහිටි කොටස් ශංඛක කණ්ඩිකා (TEMPORAL LOBES) නමින් ද හැඳින් වේ.මේ එක් එක් ප්‍රදේශ වල ඇති ස්නායු සෛල කාණ්ඩ එක් එක් කාර්යයන් සඳහා විශේෂිත වේ.


අපර කපාල ප්‍රදේශය පෙනීම ද ශංඛක ප්‍රදේශයේ ඉහළ කොටස ඇසීම ද පාලනය කරයි. ලලාට ප්‍රදේශයේ පිටුපස කොටස මාංශ පේශී ක්‍රියාකාරිත්වය ද එහි ඉදිරිපස කොටස සමාජමය කාර්යයන් ද පාලනය කරයි. ලලාට හා ශංඛක ප්‍රදේශවල ඇතුළු පැත්ත හැඟීම් හා මතකය පිළිබඳ කාර්යයන් පාලනය කරන අතර එම ප්‍රදේශය ලිම්බික් කොටස නමින් හැඳින් වේ.මොළයේ සෑම කොටසක්ම එකිනෙක හා සම්බන්ධ වන අතර ඒවායේ කාර්යයන් අතර සමායෝජනයක් ද (COORDINATION)පවතී.

ඇස, කන, නාසය හා දිව යන ඉන්ද්‍රියයන් මොළයට සම්බන්ධ වන්නේ කපාල ස්නායු මගිනි. සම හා මාංශපේශී පද්ධතිය පර්යන්ත ස්නායු මගින් ද හෘදය පෙනහැල්ල ආහාර මාර්ගය ජනනේන්ද්‍රිය අනුවේගී හා ප්‍රත්‍යානුවේගී ස්නායු මගින් ද සුෂුම්නාව හරහා මොළයට සම්බන්ධ වේ. ස්නායු මගින් අවයවල සිට ආවේග මොළයට ද ඒවායේ ප්‍රතිචාර මොළයේ සිට අවයවයන් වලටද ගෙන යයි.

මිනිස් මොළය සමාන කොටස් දෙකකට බෙදා දක්වයි.

1. වම් අර්ධ ගෝලය - Left hemisphere
2. දකුණු අර්ධ ගෝලය - Right hemisphere



මොළය මෙසේ අර්ධගෝල ලෙස බෙදී පවතින්නේ ශරීරයේ දෙපස පාලනය වන්නේ අර්ධ ගෝල වලින් නිසාවෙනි. එය පරිණාමයේ දායාදයකි.

සෞන්දර්යාත්මක, තාර්කික, සැලසුම්සහගත ක්‍රියාවන්ට ආදියට මොළයේ විවිධ ප්‍රදේශ සුවිශේෂී වේ. එය වැඩ බිමක් වැනිය එක් එක් ප්‍රදේශයන්ට සුවිශේෂි වූ කාර්යයන් පවතී. සරලවම පැවසුවහොත් මොළය වැඩ බිමක් නම් එහි මනා ශ්‍රම විභජනයක් පවතී. කාර්යයන් නිසි ආකාරයෙන් කාර්යක්ෂමව සිදු කළ හැක්කේ මොළයේ පවතින මෙම ශ්‍රම විභජනය නිසාවෙනි.

මොළයේ ඒ ඒ අර්ධගෝලයන්ට සුවිශේෂ වූ කාර්යයන්,

**වම් අර්ධගෝලය**

- භාෂාව, තාර්කික හැකියාව, සිනහව ආදියට සුවිශේෂී වේ.
- ශරීරයේ දකුණු ප්‍රදේශය පාලනය කිරීම
- වාචික හැකියාව හැසිරවීම
- අනුක්‍රමික හැකියාව
- ධනාත්මක චිත්තවේග හැසිරවීම
- ගණිතය හා විද්‍යා පිළිබඳ හැකියාවන් පාලනය

තාර්කික හැකියාව යනු අවකාශයන් හඳුනාගෙන ඊට අදාළ පරිදි හැසිරීමයි. අනුක්‍රමික හැකියාව යනු පිළිවෙළ හඳුනා ගැනීම වන අතර ධනාත්මක චිත්තවේග යනු සතුට, සිනහව ආදියයි.

**දකුණු අර්ධගෝලය**

- ශරීරයේ වම් ප්‍රදේශය පාලනය කරයි.
- ආකාශීය හැකියාව හැසිරවීම.
- චිත්තවේගීක ඉව, සංගීතය, සමස්ථය දැකීමේ හැකියාව හැසිරවීම.
- අන් අයගේ හැඟීම් හඳුනා ගැනීම.
- සිහින දැකීම සම්බන්ධව මෙන්ම හැඟීම් උත්පාදනය.
- සමස්ථය දැකීමේ හැකියාව ඇති වන්නේ දකුණු අර්ධගෝල මගිනි.

මේ ආකාරයට සමස්ථයක් වශයෙන් ගත් කළ එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් සඳහා උරුමකම් කීමට මිනිස් මොළයේ වම් සහ දකුණු අර්ධ ගෝලයන් සමත් වෙති. ඒ දෙස මනෝවිද්‍යාත්මක දෘෂ්ඨී කෝණයකින් බලන කල අපිට පෙනී යන කරුණක් වන්නේ පුද්ගල චර්යාව කෙරෙහි මෙය සෘජු ලෙස බලපාන බවත්,ඒ මත පදනම් වෙමින් පුද්ගල පෞරුෂය නිර්මාණය වන බවත්ය.එනම් අර්ධ ගෝලයන්ගෙන් වඩාත් ක්‍රියාකාරී අර්ධ ගෝලය මත පදනම් වෙමින් එකී ලක්ෂණයන් ඔස්සේ පුද්ගල චර්යාවන් නිර්මාණය වීම මත පුද්ගල පෞරුෂයේ වර්ධනය සිදු වන බවයි.

එන්. ජී. ධනුෂ්ක සම්පත් විජේසිංහ
සහකාර උපදේශන නිලධාරී

## Her Fate



It was merely an ordinary day of pathetic materialism
Darkness in the entrapment of the brutality of inequality
Emerges out of the womb of so-called patriarchy
Has covered with its misty vail of suppression
Over innocent women of utmost poverty and misery
Listen to the melancholy tonality of suffer
Lies in the heart of innocent faded blossoms
In unseen corners of maiden earth inconspicuously
She was suppressed by the harshness of the man
Who brought her up in to the world of limitless corruptions
Her pale bony being was beaten with the hands of cruelty
Her only child was grabbed away and traded to
A barely known being who then vanishes to unknown vicinity
She cried and cried till her doomed soul being consoled
Yet the flame of wrath created by her mournful lost
Cannot be blown away as her maternity adored

Immensely the blameless child-the bud of her heart
She left the man who impregnated her without will
She was pitiably dragged in to the unsightly arms of whoredom
Her pressure ignites her heart was intolerable and insufferable
Her poor soul was in search of answers on her burning fate
In one hopeless day she was driven into entrapment of intoxication
While her misery and poverty spreading over her soul
Her being had slowly gotten dependent on the delusional
Comfort of fatal Cannabis and Heroine…
As years goes on, her despondent being became shrink and skinny
And her strength was nowhere to be found
She spent limitless hours alone in utmost discomfort
She was unable to sleep originated by the intolerable pain
And suffer in heart and mind while hallucinating
Her lost child pleading for maternal love and bliss
She spread her arms wide to hold and embrace her dear child
While tears falling and whispered through an unheard voice
"My child, please forgive your mother"
Pain and utmost suffer in her soul kept questioning
Who ought to be blamed?...............
Yet another gloomy, corrupted day came to an end

**Awanthi Anuradha Wijesooriya**

**Development Officer**

## බුදුබව පතව ඇය

දස මසක් තුළ හොවා
පෝෂණය කළ ඇය
මෙලොව එළිය දුටු කල නුඹ
ලෝකයම ඇයගේ විය අත මිටින්
ඇය එසේ සිනා විට නුඹ හඬද්දී බිය වී
රතු ලේ කිරි විය සඳ දිය දහරින්
ඇගේ අත එල්ලී ගිය නුඹ පාසල්

පාසල් පෙම හමුවූ විට
අමතක විය ඇය කෙමෙන්
ඇයගේ සෙනෙහස අඩු උනිද ඒත්
නොදැනීම නුඹ මව් කිරි බිව් තොලින්
දුම්වැටි උරති දුදනන් සමඟින් ඇසුරේ
හිරු එළියෙන් මව් කිරෙන් ජීවය පැවතුනද ලොවේ
ඒ බව නොඅසා නුඹ ඇසුරු කලේ
අවසානයේ අත් වන ඉරණම නුඹවත් නොදනී
කම්බි වලින් වට කල කුටි තුළ නුඹ තනිවේ

කුමන වරද? නුඹ කළත් මේ සසරෙහි
අම්මා පමණි ඇත්තේ අවසන් වරටත්
දිනයක් කුමට සැලකීමට ඇයටත්
මතු බුදු වනවා ඇය පින් මහිමෙන්

කවිඳු පියමන්ත



## සසරම අත්නොහරී අම්මා

දස මාසයක් කුස දරා ලේ කිරි කර පොවා
හැදුවා වැඩුවා ආදරයෙන් මා රැක බලා
කැත කුණු අත ගා මා පිරිසිදු කලා
අන් ඒ අතීතයට විසිතුනක් වෙලා

මතකයි අම්මේ ඔබ මා වෙනුවෙන් කල හැමදේම
සුවඳයි අම්මේ ඔබෙ ගුණ මට සැමදාම
අතැරුණි කාලයක් ඔබගේ ගුණ මහිම
මතට ලොල් වුණා මගෙ සිත මට නොදැනීම

කුමක් කරන්නද අම්මේ මේ සසරෙ හැටි
දිනක් එයි නැවත අපහට සතුටින් සිටිය හැකි
අත ළඟ ළඟම අම්මේ ඒ දිනය එති
වෙහෙසෙන්නේ එයයි අම්මේ මම මෙහෙට ඇවිත්

වැරදි කරන්නේ අම්මේ මිනිසුන්මයි
වැරදි වලින් ගොඩ ආවෙත් මින්සුන්මයි
හිත ඇත්නම් පත කුඩා ද කීවේ මිනිසෙක්මයි
මමත් දිනනවා දවසක අම්මේ එය සත්තයි

අසිත ගයාන්



## වැට බැඳී මගේ සිත

ඉඳ හිට කී කතා
සිතේ මැව්වා නොයෙක් රටා

ජීවිතයේ දුක වැඩි නිසා
වට කර වැටක් බැන්දා මම ඒ නිසා

මතට නෑ සිතේ දැන් මා හට
මගේ ගමන මම යන නිසා

ජීවිතයේ  කෙතරම් වැරදි තිබුන ද
හරි මගට ආවේ සෙත් සෙවන නිසා

මගේ අරමුණ පැහැදිලි නිසා
බාධක නෑ දැන් මා හට

ඔ.ශාලින්ද ගිහාන්
මොරටුව



## ජීවිතය දිනන්න

කඳුල බර වැඩි නෑ නෙතට
හිතේ සතුට සොයපු අපිට ...

මතින් මිදුණු මට
නෑ හිතේ තියපු තිතට ආයේ ඉඩ ...

ජීවිතය දිනන්න
අනාගතයට සිහින දකිනවා මම ...

දැකපු සිහිනේ හැඩ
තේරුනේ මතින් මිදුණු විටයි මට ...

පෙව්  කිරි වල රසට
ණයයි අම්මේ මම නුඹට ...

ජීවිතය දිනන්න හදන මට
නෑ ඕනේ කාගේවත් සහතික ...

හිම්හිට නැගිටපු මට
හිමි වුයේ ජීවිතේ වැඩිම දුක ...

ආයේ යන්නේ නෑ කැලෑවට
වළාවකින් වැසුණු ජීවිතේ නිමා වෙලා අද ...

සිනහවකින් ඉපදුණු මට
විදාවකින් තොර ජීවිතේ දිනනවා මම ...

සමීර මධුශංක
අතුරුගිරිය



# NDDCB Treatment Centres



Talangama
"Talangama" Prevention, Treatment & Center
172, Shanthi Mawatha Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk




Nawadiganthaya
"Nawadiganthaya" Prevention, Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



Galle
"Galle" Prevention, Treatment & Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk



Kandy
"Kandy" Youth Prevention, Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa, Peradeniya
Tel : +94 81 2315504
Fax : +94 81 2315504
Email : methsevana@nddcb.gov.lk

**Tel – 011 2868794 - 6**
**Web -https://www.nddcb.gov.lk/**
**Fb – National Dangerous Drug Control Board.**